වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය

තනතුරු පුරප්පාඩු

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් සේවාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර: වතු කළමනාකරු (ආදර්ශ පොල් උයන්) II ශ්‍රේණිය MM 1 -1

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම/වැවිලි කළමනාකරණ උපාධිය සමඟ රජයේ සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අක්කර 150 කට නොඅඩු පොල් වත්තක කළමනාකරණ මට්ටමේ වසර 06 ක පළපුරුද්ද

* බාහිර සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවන්ටද ඉල්ලුම්කළ හැක.

වැටුප් කාණ්ඩය : MM 1-1
වැටුප් පරිමාණය : රු. 53,175 - 1,375x10-1,910x15 - 95,575

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	36,654.00	42,161.00	47,668.00	53,175.00
ගැලපුම් දීමනාව	4,114.00	--	--	--

තනතුර: වතු කළමනාකරු (ප්‍රධාන කාර්යාලය) II ශ්‍රේණිය MM 1 -1

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

කෘෂිකර්ම/ වැවිලි කළමනාකරණ /ආර්ථික විද්‍යාව /ව්‍යාපාර කළමනාකරණය / කළමනාකරණය / සංවර්ධන පරිපාලනය විෂයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය

සහ

රජයේ සංස්ථා /මණ්ඩල /රජය පිළිගත් ආයතනයක පරිපාලන හා වතු කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසර 05 ක සේවා පළපුරුද්ද

* කෘෂිකර්ම/ කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය ප්‍රසම්පාදන/ කටයුතු පිළිබඳ ඩිප්ලෝමාවන් තිබීම හා පරිගණක භාවිත හැකියාව හා වෙනත් භාෂාවන් පිළිබඳ දැනුම විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

වැටුප් කාණ්ඩය : MM 1-1
වැටුප් පරිමාණය : රු. 53,175 - 1,375x10-1,910x15 - 95,575

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	36,654.00	42,161.00	47,668.00	53,175.00
ගැලපුම් දීමනාව	4,114.00	--	--	--

තනතුර: සහකාර වතු කළමනාකරු (ආදර්ශ පොල් උයන්) II ශ්‍රේණිය JM 1-2

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම/වැවිලි කළමනාකරණ උපාධිය සහ රජයේ හෝ රජය පිළිගත් ආයතනයක පොල් වතු කළමනාකරණය පිළිබඳ වසර 04 ක සේවා පළපුරුද්දක් ලබාතිබීම.

* මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ වසරක පුහුණු පදනමක් යටතේ වන අතර පුහුණුවෙන්පසු සාමාන්‍යාධිකාරී විසින් පත්කරනු ලබන කළමනාකරණ මට්ටමේ කමිටුවක් මඟින් ස්ථිර සේවයට බඳවා ගැනීම පිළිබඳ ලබාදෙන නිර්දේශය අනුව ස්ථිර සේවයට බඳවා ගනු ලැබේ.

වැටුප් කාණ්ඩය : JM 1-2
වැටුප් පරිමාණය : රු. 43,355 - 755x10 - 1135x18 - 71,335

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	29,876.00	34,369.00	38,862.00	43,355.00
ගැලපුම් දීමනාව	5,192.00	699.00	--	--

තනතුර: සහකාර වතු ප්‍රවාහන හා යාන්ත්‍රෝපකරණ කළමනාකරු (ආදර්ශ පොල් උයන්) II ශ්‍රේණිය JM 1-2

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

I. විශ්වවිද්‍යාලප්‍රතිපාදනකොමිෂන්සභාව විසින් පිළිගත් විද්‍යාවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක්

හෝ

II. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

IV. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

* වාහන වලට අදාල වාර්තා නඩත්තු කිරීම පිළිබඳව පළපුරුද්දක් තිබීම, වාහන සමූහයක ක්‍රියාකාරීත්වය සහ එහි සේවක මණ්ඩල අධීක්ෂණය කිරීම පිළිබඳ හැකියාවක් තිබීම, පෙට්‍රල් හා ඩීසල් වාහන , ඉඩම් වාහන සහ බර වාහනපිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබාතිබීම විශේෂ සුදුසුකමක් වේ.

වැටුප් කාණ්ඩය : JM 1-2
වැටුප් පරිමාණය : රු. 43,355 - 755x10 - 1135x18 - 71,335

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	29,876.00	34,369.00	38,862.00	43,355.00
ගැලපුම් දීමනාව	5,192.00	699.00	--	--

තනතුර : සහකාර වතු අලෙවි කළමනාකරු (ආදර්ශ පොල් උයන්) II ශ්‍රේණිය JM 1-2

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අලෙවි කළමනාකරණය විෂය සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්

සමඟ

රාජ්‍ය /සංස්ථා හෝ රජය පිළිගත් ආයතනයක අලෙවි කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 04 ක සේවා පළපුරුද්ද

වැටුප් කාණ්ඩය : JM 1-2
වැටුප් පරිමාණය : රු. 43,355 - 755x10 - 1135x18 - 71,335

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	29,876.00	34,369.00	38,862.00	43,355.00
ගැලපුම් දීමනාව	5,192.00	699.00	--	--

තනතුර: සහකාර වතු(සිවිල්) කළමනාකරු (ආදර්ශ පොල් උයන්) II ශ්‍රේණිය JM 1-2

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

I. විශ්වවිද්‍යාලප්‍රතිපාදනකොමිෂන්සභාව විසින් පිළිගත් විද්‍යාවේදී ඉංජිනේරු (සිවිල්) උපාධියක්

හෝ

II. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

IV. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : JM 1-2
වැටුප් පරිමාණය : රු. 43,355 - 755x10 - 1135x18 - 71,335

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	29,876.00	34,369.00	38,862.00	43,355.00
ගැලපුම් දීමනාව	5,192.00	699.00	--	--

තනතුර: වතු සත්ත්ව පාලන නිලධාරී (ආදර්ශ පොල් උයන්) III ශ්‍රේණිය MA 2 -1

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක් සමඟ පිළිගත් ආයතනයක සත්ත්ව පාලනය විෂය සහිතව ලබාගත් කෘෂිකර්ම ඩිප්ලෝමාව හෝ පිළිගත් ආයතනයක සත්ත්ව පාලන ඩිප්ලෝමාව සහිත වසර 01 ක සේවා පළපුරුද්ද

වයස : 18ට නොඅඩු හා අවු.35ට නොවැඩි විය යුතුයි.දැනටමත් රජයේ/සංස්ථා/මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.
වැටුප් කාණ්ඩය : MA 2-1
වැටුප් පරිමාණය : රු. 30,310–300x10-350x7-495x4-660x20 - 50,940

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	20,890.00	24,030.00	27,170.00	30,310.00
ගැලපුම් දීමනාව	6,662.00	3,522.00	382.00	--

තනතුර: වතු ක්ෂේත්‍ර නිලධාරී (ආදර්ශ පොල් උයන්) III ශ්‍රේණිය MA 2 -1

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක් සමඟ පිළිගත් ආයතනයක කෘෂිකර්ම / වැවිලි කළමනාකරණ / කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දෙඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම හා පොල් වගා ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

වයස : 18ට නොඅඩු හා අවු.35ට නොවැඩි විය යුතුයි.දැනටමත් රජයේ/සංස්ථා/මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.
වැටුප් කාණ්ඩය : MA 2-1
වැටුප් පරිමාණය : රු. 30,310–300x10-350x7-495x4-660x20 - 50,940

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2017.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමි වේ.

	2017	2018	2019	2020
වැටුප රු.	20,890.00	24,030.00	27,170.00	30,310.00
ගැලපුම් දීමනාව	6,662.00	3,522.00	382.00	--

වෙනත් කොන්දේසි :

I. සෑම ඉල්ලුම්කරුවෙක් ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

අයදුම්පත් :

- කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ (MA 2-1) තනතුරු සඳහා හැර අනෙකුත් තනතුරු සඳහා වයස 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.
- ජීව දත්ත හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි **සහතිකවල පිටපත් සමඟ** අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. තවද දැනටමත් රජයේ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මඟින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ **ඉහළ වම් කෙළවරේ අදාළ** තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන්කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම්කරන්නේ නම් එක් තනතුරකට එක බැගින් වනසේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කල යුතුවේ.
- සියලුම අයදුම්පත් 2017.06.02 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

සභාපති,
පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.